# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය

## 01 දිවැසිවැකි හා කිතු උපත හා විශිෂ්ඨකත්වය

## සේවකත්වය

## අවබෝධය පිරික්සුම - 01

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

01. දිවැසිවරයා යනු කවුරුන්ද?
02. දිවැසිවර කාර්යය වන්නේ කුමක්ද?
03. මරියතුමිය ප්‍රකාශ කළ දිවැසිවැකිය අනුව දරුවාට තබන්න පැවසූ නාමය කුමක්ද? එහි අර්ථය කුමක්ද?
04. යෙසායා දිවැසිවරයා පවසන පරිදි දෙවියන් වහන්සේගේ සැළැස්ම ආරම්භයේ පටන් ක්‍රියාත්මක වූ බව පැහැදිලි වන්නේ කෙසේද?
05. අන්ධකාරයේ ජීවත් වූ සෙනඟ දුටුවේ කුමක්ද?
06. කිතු උපත සිදුවන කාලයේ යුදා සමාජයේ පසුබිම කුමනාකාරද?
07. යෙසායා දිවැසිවරයා තම අනාවැකිය අනුව උපදින දරුවා පිළිබඳ දෙන සහතිකය කුමක්ද?
08. ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිත ආදර්ශය සහ මෙහෙවර පිළිබඳ පැවසුවේ කුමක්ද?
09. පලස්තීනය යටත්ව පැවතුනේ කාටද?
10. ජුදෙව් ජනතාවගේ බලාපොරොත්තුව කුමක්ද? එම බලාපොරොත්තුව ඉටු කළේ කවුද?
11. මෙසියස් යන්නෙහි අර්ථය කුමක්ද?
12. ජේසුස් වහන්සේ විසින් සිදු කරන මෙහෙවර මඟ පිළියෙල කිරීමට පැමිණියේ කවුද? ඔහු පිළිබඳ දිවැසි වැකි පැවසුවේ කවුද?
13. එම දිවැසි වැකි අතරින් යෙසායා පැවසුවේ එතුමාගේ මෙහෙය පිළිබඳ දිවැසි වැකිය කුමක්ද?
14. ස්නාවක ජොහාන් තම මෙහෙය ආරම්භ කරන විට සමාජ තත්වය කෙසේද?
15. රෝම අධිරාජ්‍යයට ගැතිකම් කල අය කවුද?
16. ජේසුස් වහන්සේ සැම විටම ක්‍රියා කලේ කෙසේද?
17. ස්නාවක ජොහාන් තම ශ්‍රාවකයන්ට ජේසුස් වහන්සේව හඳුන්වාදුන්නේ කෙසේද?
18. ජේසුස් වහන්සේගේ සේවකයා සහ පරිත්‍යාගශීලීබව පිලිප්තුමා පහදාදුන්නේ කාටද? එය කුමක්ද?
19. ක්‍රිස්තුස් වහන්සේ ජීවිත පූජාවෙන් ස්ථාපිත වූයේ කුමක්ද?
20. අප වෙනුවෙන් දුක් විඳින සේවකයා ලෙස තම ජීවිතය පූජා කරන්නේ කෙසේද?

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

## ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
## 02 දේව සැලැස්මට අවනත වූවන්
## සේවකත්වය
## අවබෝධය පිරික්සුම - 02

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. දේව ප්‍රසාද සහිත දේව සැලැස්මට අනුව උපත සිදුවූයේ කාගේද?
2. ඔහුට පැවරුණු කාර්යය කුමක්ද?
3. එම සුවිශේෂී උපත් දැනුම දුන්නේ කවුද?
4. එම සුවිශේෂී අවස්ථාවේ දේව මාලිගාවේ සිටියේ කවුද?
5. ඔහු එහි සිටියේ කුමක් කරමින්ද?
6. දේව දූතයා ඔහුට පැවසුවේ කුමක්ද? ඔහුගේ ප්‍රතිචාරය කුමක්ද?
7. ඔහුගේ පුත්‍රයා ගැන පැවසූ අනාවැකි මොනවාද?
8. ඔහු පෙරටුව ගමන් කරන්නේ කාගේ අනුහාවයෙන්ද?
9. දිව්‍යැසි වැකි සම්පූර්ණ කරමින් ඔහු කලේ කුමක්ද?
10. සෙකරියස් පූජකතුමාගේ ජීවිත ශෛලිය කෙබඳුද?
11. දිව්‍යැසි වැකිය විශ්වාස නොකල නිසා සෙකරියස්තුමා මුහුණ දුන් අත්දැකීම් මොනවාද?
12. දරුවාට නම් තැබීමේදී සිදු වූයේ කුමක්ද? නම් තැබුවේ කවුද?
13. දරුවාට තැබුනාවූ නම කුමක්ද? එහි අර්ථය ලියන්න.
14. එලිසබෙත්තුමිය ජීවත් වූයේ කොහේද? ඇයව බලන්න පැමිණියේ කවුද?
15. එලිසබෙත්තුමිය ඇය පිළිගන්නා විට පැවසුවේ කුමක්ද?

❖ පහත සඳහන් වාක්‍ය හරි නම් ✓ලකුණද, වැරදි නම් × ලකුණද යොදන්න.

16. ගාබ්‍රියෙල් දේව දූතයා නිතරම ගෙනෙන්නේ සුභාරංචි පමණය. ( )
17. එලිසබෙත්තුමියට දේව දූතයා දර්ශනය විය. ( )
18. සෙකරියස්තුමා ප්‍රීතියෙන් දේව පණිවිඩය පිළිගත්තේය. ( )
19. මරියතුමිය එලිසබෙත්තුමියගේ ඥාති සොහොයුරියකි. ( )
20. අප දේව පණිවුඩය විශ්වාස කල යුතුය. ( )

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
# 03 අති විශේෂ උපත්
# සේවකත්වය
# අවබෝධය පිරික්සුම - 03

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. ගාබ්‍රියෙල් දේව දූතයා විශේෂ උපත් පිළිබඳ දැනුම් දුන්නේ කවුරුන්හටද?
2. මතෙව් සුභාරංචියේ පමණක් සඳහන් වන ජේසු උපතෙහි සුවිශේෂී දෙය කුමක්ද? ඒ අනුව ගමන් කලේ කවුද? ඔවුන් ගෙන ආවේ මොනවාද?
3. ස්නාවක ජොහාන්තුමාගේ උපතේ විශේෂත්වය කුමක්ද?
4. දරු උපතින් පසු ශුද්ධාත්මයාණන් පූර්ණ වූ සෙකරියස් තුමා කලේ කුමක්ද?
5. සෙකරියස්ගේ ප්‍රශංසා ගීතයේ අවධාරණය කරන්නේ මොනවාද?
6. සංගණනය පැවැත්වූ රෝම අධිරාජ්‍යයා කවුද? එය පවත්වන්නේ අවුරුදු කීයකට වරක්ද?
7. සංගණනය සඳහා තම උපන් දේශය බලා ගිය යුවල කවුද? ඔවුන්ගේ උපන් දේශය කොහේද?
8. එම ගමනේදී සිදුවූයේ කුමක්ද?
9. දේව දූතයන් සුභාරංචිය රැගෙන ප්‍රථමයෙන් ගියේ කොහාටද?
10. දේව දූත පණිවුඩය ලියන්න.
11. ස්නාවක ජොහාන්තුමාගේ ජීවිත ශෛලය කුමනාකාරයෙන්ද?
12. ජොහාන් තම සේවය ආරම්භ කරන තෙක් සිටියේ කොහේද?
13. ඔහු සේවය ඇරඹුයේ කොහේදීද? කුමක් කරමින්ද?
14. එදා ජුදෙව් වරුන්ගේ අපේක්ෂාව කුමක්ද?
15. රෝම අධිරාජ්‍යයාට යටත් වූ පලස්තීනයේ විසූ ජුදෙව්වන් තම ජීවිත ගත කලේ කෙසේද?
16. ව්‍යාවස්ථාව තම අර්ථකතනය කරමින් ජනතාව පීඩනයට පත් කලේ කවුද?
17. 'පව්කරුවන්' ලෙස සමාජයේ ප්‍රතික්ෂේප වූයේ කවුරුන්ද?
18. ජේසුස් වහන්සේගේ අනුගාමී වීමෙන් ලබන්නේ මොනවාද?

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය

# 04 ජේසුස් වහන්සේ සහ ජුදෙව් චාරිත්‍ර

# සේවකත්වය

# අවබෝධය පිරික්සුම - 04

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. ජේසුස් වහන්සේගේ දෙමව්පියන් ඉටු කල ජුදෙව් චාරිත්‍ර ගැන සඳහන් වන සම දර්ශක සුබසුන කුමක්ද?
2. ජුදෙව් ආගමික පිලිවෙත් සහ මංගල්‍යයන් ඒකාබද්ධ වන්නේ කුමක් සමඟද?
3. ජුදෙව්වන් මෙම වත්පිලිවෙත් ඉටුකලේ කෙසේද?
4. ඊශ්‍රායෙල් ජනතාවගේ ඉතිහාසය හා සම්බන්ධ වන ජුදෙව් චාරිත්‍රය කුමක්ද?
5. එම චාරිත්‍රය ඉටු කිරීමට නියෝග ලබාදුන්නේ කාටද? එමගින් අවධාරණය කරන්නේ කුමක්ද?
6. උපත් දැනුම් දුන් ගාබ්‍රියෙල් දේව දූතයා තබන්ට කී නම කුමක්ද? එහි අර්ථය ලියන්න. නම තැබුවේ කුමන අවස්ථාවේදීද?
7. නික්මයාමේ සිද්ධිය හා සම්බන්ධ වන වත්පිලිවෙත් කුමක්ද?
8. එම පිලිවෙත් ඉටු කරන ළදරුවෙක් ඉපදී දින කීයකට පසුද? එය සිදු කරන්නේ කොහේදීද?
9. එම අවස්ථාවේදී පූජා කල යුත්තේ මොනවාද?
10. මරියතුමී සහ ජෝසෙප්තුමා ජේසුස් වහන්සේ වෙනුවෙන් පූජා කලේ මොනවාද?
11. අද කිතුණු සසුන තුල පවතින පුද්ගලික සහ සාමූහික ආගමික වාතාවරණය ශක්තිමත් කරන වත් පිලිවෙත් මොනවාද?
12. කැප කිරීමේ පිලිවෙත් ඉටු කිරීමට ජේසුස් වහන්සේව රැගෙන ආ විට එහි සිටියේ කවුරුන්ද?
13. ඔවුන් ජේසුතුමාව හඳුනාගන්නේ කෙසේද? එහි අර්ථය කුමක්ද?
14. සිමියොන් යන නමෙහි තේරුම කුමක්ද?
15. මෙසියෙස් යන හෙබ්‍රෙව් වචනයේ ග්‍රීක වචනය ලියන්න.
16. සෑම යුදෙව්වෙක්ම ජෙරුසෙලමේ දේවමාලිගාවට පැමිණෙන්නේ ඇයි? එම චාරිත්‍රය සඳහා වසරකට කී වරක් සහභාගී විය යුතුද?
17. ජුදෙව් පාස්කුව යනු කුමක්ද?
18. එම වත්පිළිවෙත් ඉටු කරන්නට පැමිණි ජේසුතුමා හා දෙමාපියන් පිළිබඳව කෙටි විස්තරයක් කරන්න.

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය

## 05 පෙරමඟ දූත සේවය

## අවබෝධය පිරික්සුම - 05

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. ජේසුස් වහන්සේගේ මෙහෙවරට මූලික පසුබිම සකසමින් දූත මෙහෙවර කළේ කවුද?
2. රෝම අධිරාජ්‍යයාට යටත්ව තිබූ ප්‍රදේශ මොනවාද?
3. ජුදා ආගමික උත්තම පූජක පදවිය දැරුවේ කවුද?
4. රෝම අධිරාජ්‍යයාට විරුද්ධව ජනතාවට ක්‍රියා කළේ ඇයි?
5. දෙවියන් වහන්සේගේ කැමැත්ත අනුව ජීවත් වීම බාහිර සලකුණක් ලෙස සිදු කළේ කුමක්ද?
6. එය හඳුන්වන නම කුමක්ද? එම කාර්යය ඉටු කළේ කොහේදිද?
7. ස්නාවක ජොහාන් තුමාගේ මූලික පරමාර්ථය වූයේ කුමක්ද?
8. ජේසුස් වහන්සේ පිළිගැනීමට බාධාවක් වන්නේ මොනවාද?
9. ස්නාවක ජොහාන් අනුශාසනා කළ ජන කණ්ඩායම් කවරේද? ඔවුන්ට කල අනුශාසනාවන් ඉදිරියෙන් ලියන්න.
10. ජුදා ආගමික ජනතාව තම පියාණන් ලෙස හඳුනාගත්තේ කාවද? ඔහුට දරු පරපුරක් උපදවන්න දෙවියන් වහන්සේට හැකි බව පැවසුවේ මොනවා වලින්ද?
11. ජුදෙව් ජනතාව නැගූ ප්‍රශ්නය කුමක්ද?
12. එම ගැටලුව විසඳමින් ජොහාන්තුමා දුන් පිලිතුර කුමක්ද?
13. මනස්ථාපනයේ බෞතීස්මය ජොහාන්තුමා ඉටු කිරීම තුලින් අවධාරණය වූ ගුණාංගය කුමක්ද?
14. මිනිස් ජීවිතය පිළිබඳ අවසාන තීරණය ගන්නේ කවුද?
15. ස්නාවක ජොහාන්තුමාගේ පණිවිඩය කුමක්ද?
16. පුරාණ ගිවිසුමේ ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැඩ සිටීම සංකේතවත් කළේ කුමකින්ද? එය පැහැදිලි වන පුරාන ගිවිසුමේ අවස්ථාවක් ලියන්න.
17. ස්නාවක ජොහාන්තුමා තරවටු කළේ කාටද? එම වරද කුමක්ද? එම නිසා එතුමාට ලැබුන දඬුවම කුමක්ද?
18. අද සමාජයේ ජීවත් වන අපට එතුමාගේ අනුශාසනාවෙන් ලැබෙන පණිවිඩය කුමක්ද?
19. සමාජය තුල අප ඕනෑම කාර්යයක් කිරීමේදී අත්‍යාවශ්‍ය වන්නේ කුමක්ද?
20. ඔබගේ ජීවිතය වෙනස් විය යුතු ගති පැවතුම් මොනවාද? ඒවා වෙනස් කරගන්නේ කෙසේද?

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය

## 06 නාසරෙත් හී දහම් දෙසුම

## අවබෝධය පිරික්සුම - 06

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. ස්නාවක ජොහාන්තුමා අතින් බෞතීස්ම ලැබ ජේසුතුමා ගියේ කොහාටද?
2. ජේසුස් වහන්සේ තම මෙහෙවර ඇරඹුවේ කොහේදීද?
3. පලස්තීන ජනතාව පීඩනයට පත්ව සිටියේ කුමන අයුරින්ද?
4. ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ පදනම කරගන්නේ කුමක්ද?
5. ජුදෙව් නමස්කාරයේ කේන්ද්‍රස්ථානය කොහේද?
6. ජෙරුසලමෙන් ඈත්ව ජීවත් වූ ජුදෙව්වන් තම ආගමික කටයුතු සඳහා රැස්වූයේ කොහාටද?
7. සිනගෝගයේ ප්‍රධාන කාර්යය කුමක්ද?
8. ජේසුස් වහන්සේ හැදුනු වැඩුනු නගරය කුමක්ද? එතුමා එහි ජීවත් වූයේ කෙසේද?
9. ජේසුස් වහන්සේ නාසරෙත් නුවර සිනගෝගයේ දී කළ ප්‍රකාශය කුමක්ද?
10. එම ප්‍රකාශය තුළින් විදහා පෑවේ කුමක්ද?
11. එම ප්‍රකාශය එතුමන් උපුටා ගන්නේ කුමන ග්‍රන්ථයෙන්ද? එහි සඳහන් වන පැරණි ගිවිසුමේ කතාන්දර මොනවාද?
12. එම ප්‍රකාශය කෙටියෙන් දක්වන්න.
13. එදා ජුදා සමාජයේ දිළිඳු අයට හිමි ස්ථානය කුමක්ද?
14. දෙවියන් වහන්සේ විසින් නිර්මාණය කළ මිනිසා ගැන උන් වහන්සේගේ බලාපොරොත්තුව කුමක්ද?
15. ජුබිලි වසරේදී සිදු වන්නේ කුමක්ද?
16. ජේසුස් වහන්සේ යොදා ගත් දිව්‍යසිවර ප්‍රකාශයේ අවසානය පාඨය කවුරුන් වෙනුවෙන්ද?
17. නාසරෙත් හී ප්‍රකාශයට එරෙහි වූ ජනතාවය ජේසුස් වහන්සේ පළමු අවස්ථාවේදී ප්‍රතිචාර දැක්වූයේ කෙසේද?
18. දෙවනුව එතුමන් ජනතාවට දැනෙන්නට සැලැස්වූයේ කුමක්ද?
19. ජේසුස් වහන්සේ නාසරෙත් හී ප්‍රකාශය මඟින් තහවුරු කළේ කුමක්ද?
20. ජුදෙව් සමාජය තෙලින් ආලේප කරනු ලබන්නේ කවුරුන්ද?

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
# 07 දේව කැඳවීමට ප්‍රතිචාර දක්වමු
# අවබෝධය පිරික්සුම - 07

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. ජේසුස් වහන්සේ තම සේවයට තෝරා ගත් ගණන කීයද? ඔවුන්ට තැබූ නම කුමක්ද?
2. එම කණ්ඩායමට අමතර සේවය සඳහා තෝරාගත් අය කවුද? කී දෙනාද?
3. නාසරෙත් හී දේශනනේ පසු ජේසුස් වහන්සේ ජනතාවට මුණ ගැසෙන්නේ කොහේදීද? එම ස්ථානය හඳුන්වන අනික් නම් මොනවාද?
4. ජේසුස් වහන්සේ මුල් ගෝලයින්ව කැඳවනු ලැබුවේ කොහේදීද? කවුද? කී දෙනාද?
5. ඔවුන්ගේ රැකියාව කුමක්ද?
6. සංවාදයක් ඇතිවූයේ කා සමගද?
7. ජේසුස් වහන්සේගේ අණට අවනත වූ ඔහු කළේ කුමක්ද?
8. ජේසුස් වහන්සේ ඔහුට දුන් අභියෝගය කුමක්ද?
9. මෙම අවස්ථාවේදී ජේසුස් වහන්සේ අනුගාමී වූ සීමොන් තුලින් ඉස්මතු වන කරුණු 3 කවරේද?
10. 'ප්‍රේරිත' යන්නෙහි අර්ථය කුමක්ද? ඔවුන් තෝරාපත් කරගැනීමට පෙර කළේ කුමක්ද?
11. ජේසුස් වහන්සේගේ ගෝලයන් අතර බදු අයකළ තැනැත්තා හා අන්තවාදියෙක් වූ ගෝලයන් දෙදෙනා කවුද?
12. ජේසුස් වහන්සේව දෙවිඳුන් හා ස්වාමීන් ලෙසට අවසානයේදී පිලිගන්නේ කවුද?
13. ගෝල කණ්ඩායමේ මුදල් භාරව සිටියේ කවුද?
14. ජේසුස් වහන්සේ සුභ අස්න ප්‍රකාශ කිරීම සඳහා සූදානම් කළ චාරිකා 2ක කුමක්ද? සහභාගී වූ ගණන කීයද?
15. ඒ ඒ කණ්ඩායම් වලට දුන් අවවාද කවරේද?
16. ඔවුන්ට පැවරූ කාර්යයන් මොනවාද?
17. 'වගවලසුන් මැදට යවමි' යන්නෙන් අදහස් කළේ කුමක්ද?
18. සේවයේ ප්‍රතිඵල ගැන ජේසුස් වහන්සේගේ ඉගැන්වීම වූයේ කුමක්ද?
19. 'ගොයම නම් බහුලය, ගොවීහු විරලය' යන පාඨය ජේසුස් වහන්සේ පැවසුවේ කාටද? එයින් ඉස්මතු කළේ කුමක්ද?
20. මෙම චාරිකා 2 අධ්‍යනයෙන් අපට වැටහෙන ප්‍රධාන සත්‍යතාවන් 5ක් ලියන්න.

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
# 08 සාමාජයට නව අරුතක්
# අවබෝධය පිරික්සුම - 08

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. කිතුණු පවුලේ නිර්මාතෘ කවුද?
2. ජේසුස් වහන්සේ පැහැදිලි කළ නව පවුල් සංකල්පය කුමක්ද? එයින් අදහස් කරන්නේ කුමක්ද?
3. ක්‍රිස්තියානි ජීවිතය කුමනාකාරද?
4. ජුදෙව් සමාජයේ කැපී පෙනෙන අංගය කුමක්ද?
5. ඒ බව සනාථ කරන උදාහරණ දක්වන්න.
6. ජේසුස් වහන්සේ මෙම තත්වය වෙනස් කලේ කෙසේද?
7. ජේසුස් වහන්සේ නිතරම ගිය නිවස පිහිටා තිබුණේ කොහේද? එහි සිටියේ කවුද?
8. එම නිවස තුළ සමාජයට නව අරුතක් එක් කරමින් සිදු වූ විශේෂ දෙය කුමක්ද?
9. ක්‍රිස්තු උත්ථානයට ප්‍රථමයෙන් සාක්ෂි දැරුවේ කවුද?
10. ජේසුස් වහන්සේ ජුදෙව් ආකල්පය අභියෝගයට ලක් කරමින් කාන්තාවක් කළ ක්‍රියාව අගය කලේ කොහේදීද? එම ක්‍රියාව කුමක්ද?
11. එම ක්‍රියාව සම්බන්ධව අවධාරණය කරන ප්‍රධාන හේතු දක්වන්න.
12. රෝගී තත්වයන් නිසා සමාජයෙන් ඇති පීඩා විඳිමින් සිටි කාන්තාවන් දෙදෙනා කවුද?
13. ඔවුන් තම ජීවිතවලට නව අරුතක් එක්කර ගත්තේ කෙසේද?
14. සමාජයෙන් කොන් කළ අය අතරෙන් අසීමිත දයානුකම්පාව ලැබුවේ කවුද?
15. ඔවුන්ගේ ජීවිත වෙනස් වූයේ කෙසේද?
16. ජේසුස් වහන්සේ දරුවන්ව අගය කළ අවස්ථා 3ක් ලියන්න.
17. දෙමාපියන් දරුවන්ව රැගෙන ආවේ කොහාටද? එවිට සිදුවූයේ කුමක්ද?
18. දරුවන්ගේ ජීවිත රැකගන්න පිණිස උන්වහන්සේ නියම කළ දඬුවම කුමක්ද?
19. අද සමාජයේ දරුවන්ට හිමි තත්වය කුමක්ද?
20. අසීසයේ ප්‍රැන්සිස් තුමාගේ යැදුමෙන් ඔබට / සමාජයට ගෙන දෙන නව අරුත කුමක්ද?

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
## 09 ව්‍යවස්ථාවේ හරය ප්‍රේමයයි
## අවබෝධය පිරික්සුම - 09

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. ජේසුස් වහන්සේ මෙලොවට වැඩිය අරමුණ ප්‍රකාශ කලේ කොහේදීද?
2. එය සඳහන් වන පැරණි ගිවිසුමේ ග්‍රන්ථය කුමක්ද?
3. ජේසුස් වහන්සේ තම මෙහෙවර අරඹණ විට පලස්තීනයේ පසුබිම කෙබඳුද?
4. ජුදෙව් ජාතිය දෙකඩව සිටියේ කුමන කාලයේ සිටි ද? එය කෙසේද?
5. ජුදෙව්වන්ට ආගමික නිදහස ලබාදුන්නේ කවුද? ජුදෙව්වන් අනුගමනය කළේ කුමක්ද?
6. සමකාලීන ජුදෙව් ප්‍රධානීන් ලෙස වැජඹුනේ කවුරුන්ද?
7. එම කණ්ඩායම් දෙක වර්ගීකරණය කරන්න.
8. පරිසිවරුන් තම ධාර්මිකබව පෙන්නුවේ කෙසේද?
9. විනයධරයන්ගේ කාර්යභාරය කුමක්ද?
10. පව් කමා කිරීමේ බලය ඇත්තේ කාටද? ජේසුස් වහන්සේ එසේ සිදු කළ විශේෂ අවස්ථා කුමක්ද?
11. මෙම අවස්ථාවේදී පරිසිවරුන් ක්‍රියාකලේ කෙසේද?
12. අංශභාග රෝගියාට ජේසුස් වහන්සේ කරන්න කීවේ කුමක්ද?
13. එකල බදු අයකරන්නන්ට සමාජය තුළ තිබූ තත්වය කුමක්ද?
14. 'මා අනුව එන්නැයි' ජේසුස් වහන්සේ පැවසුවේ කාටද?
15. පරිසිවරුන් උපවාස පිලිබඳව ජේසුස් වහන්සේ වෙත එල්ල කළ ගැටළුව කුමක්ද? ජේසුස් වහන්සේගේ පිලිතුර කුමක්ද?
16. ආගඥා දහයෙන් එකක් විකෘති කොට පරිසිවරුන් අරථකථනය කළේ කුමක්ද? එහිදී ජේසුස් වහන්සේව පරික්ෂාවට ලක් කිරීමට ඔවුන් කටයුතු කළේ කෙසේද? එතුමා එය ව්‍යර්ථ කරමින් ප්‍රකාශ කල වදන් ලියන්න.
17. ජේසුස් වහන්සේ සබත් දින කළ යුත්තේ යහපත ද? අයහපතද? යන්නට පැහැදිලි කිරීමට කළ ක්‍රියාව කුමක්ද? එම ක්‍රියාව තුලින් නැවත අපට සිහි ගන්වන්නේ කුමක්ද?
18. ජුදෙව් චාරිත්‍රයක් වුවද ජේසුස් වහන්සේ විසින් කඩ කළ බවට චෝදනා නගන ලද චාරිත්‍රය කුමක්ද?
19. දෙවියන් වහන්සේගේ රාජ්‍යය ඔබ අතරෙහි යැයි ජේසුස් වහන්සේ පැවසුවේ කුමන ප්‍රශ්නය නැගූවිටද?
20. 'සබත මිනිසා උදෙසා මිස මිනිසා සබත උදෙසා නොව බව' පැවසීමෙන් ජේසුස් වහන්සේ අවධාරණය කළේ කුමක්ද?

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය

## 10 අභියෝග මැද සේවය

## අවබෝධය පිරික්සුම - 10

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. ග්‍රීක අදහස් ජුදෙව්වන්ට ආදේශ කිරීමට උත්සහ කළේ කවුද?
2. එම අදහස් පිලිගෙන අනුගමනය කළ කණ්ඩායම හඳුන්වන නම කුමක්ද? එම කණ්ඩායම පැවතෙන්නේ කාගෙන්ද?
3. මොවුන් දැරූ විශේෂ තනතුරු මොනවාද?
4. මෙම කණ්ඩායමේ කේන්ද්‍රස්ථානය කොහේද?
5. ඔවුන් රෝම රජයට සහය දුන්නේ මොනවාටද? ඒ ඇයි?
6. මොවුන් තුළ හඳුනාගත හැකි ගතානුගතික ලක්ෂණ මොනවාද?
7. ජේසුස් වහන්සේ ජෙරුසලමට වැඩි හැම අවස්ථාවකම කළේ කුමක්ද?
8. සද්දුසිවරු අවතස්කේරුවට ලක් කළේ මොනවාද?
9. ජේසුස් වහන්සේ දේව මාලිගාව පවිත්‍ර කිරීමේදී සද්දුසිවරුන් නැගූ ප්‍රශ්නය කුමක්ද?
10. ජේසුස් වහන්සේ ඔවුන්ගේ ප්‍රශ්නයට ප්‍රතිචාර දැක්වූයේ කෙසේද?
11. තම තමන්ගේ සිත් සෝදිසි කරගැනීමට ජේසුස් වහන්සේ සද්දුසිවරුන්ට ගෙන හැර දැක්වූ උපමාව කුමක්ද?
12. එම උපමාව අනුව මිනිසා පාපයෙන් ගලවා ගන්නා දෙවි සමිදාණන් එව්වේ කවුරුන්ද?
13. 'එසේ වී නම් ගෘහ ශිල්පීන් ඉවතලූ ගලම කොණේ ප්‍රධාන ගල වී ඇත' යනුවෙන් ජේසුස් වහන්සේ අදහස් කළේ කුමක්ද?
14. ජුදෙව්වන්ට බදු ගෙවීටම සිදුවූ බදු වර්ග දෙක හා එය ගෙවූ කාසි වර්ග මොනවාද?
15. ජේසුස් වහන්සේව නැවත වරදකරුවෙකු බවට පත් කිරීම උන් වහන්සේ වෙත ඉදිරිපත් කළ ප්‍රශ්නය කුමක්ද?
16. ජේසුස් වහන්සේ එම ප්‍රශ්නයට ප්‍රතිචාරය දැක්වූයේ කෙසේද?
17. ජේසුස් වහන්සේ දුන් පිළිතුරින් අපට පැහැදිලි කරන්නේ කුමක්ද?
18. පුනර්ජීවනය පිළිබඳව ඔවුන් නැගූ ප්‍රශ්නයට ජේසුස් වහන්සේ දුන් පිළිතුර කුමක්ද?
19. මෝසෙස් දෙවියන් වහන්සේට ඇමතුවේ කෙසේද?
20. ජේසුස් වහන්සේගේ මෙහෙවරේ මෙන් අපගේ ජීවිතේදී පැමිණෙන අභියෝග වලට අප මුහුණ දෙන විට කල යුත්තේ කුමක්ද?

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
# 11 අභියෝග මැද සාමය
# අවබෝධය පිරික්සුම - 11

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. ජේසුස් වහන්සේ අවසන් වරට ජෙරුසෙලමට ගියේ කෙසේද?
2. එම ගමන යෑම සඳහා උන්වහන්සේ තෝරා ගත්තේ කුමක්ද?
3. එම ගමන පිලියෙල කිරීම සඳහා යැවූ ගණන කීයද? ඔවුන්ට පැවසුවේ කුමක්ද?
4. ජේසුස් වහන්සේ රාජ තේජසින් එන බව පැවසූ දිවැසිවරයා කවුද?
5. මෙම සිදුවීම තුල අභියෝග එල්ල වූ පාර්ශවයන් මොනවාද?
6. මෙම අභියෝග එල්ලවූ පාර්ශවයන්ගේ යේසුස් වහන්සේගේ පැමිණීම පිළිබඳ අරමුණ වූයේ කුමක්ද?
7. දේව රාජ්‍යයේ පදනම කුමක්ද?
8. ජේසුස් වහන්සේ යෙරුසලමට සිදුවූ විපත ගැන හඬමින් පලකල අනාවැකිය කුමක්ද?
9. ජේසුස් වහන්සේ තම ගමන සඳහා කොටළුවෙක් තෝරාගත්තේ ඇයි?
10. ජේසුස් වහන්සේ මීට පෙර දේවමාලිගයට පැමිණි අවස්ථාවන් වලදී කළේ කුමක්ද?
11. ජේසුස් වහන්සේ අවසන් වරට දේව මාලියයට පැමිණෙන විට ජෙරුසලමට සිදුවූයේ කුමක්ද?
12. ජේසුස් වහන්සේ මෙම අවස්ථාවේ ක්‍රියා කළේ කෙසේද?
13. දේව මාලිගය පවිත්‍ර කිරීමේ තුලින් ජුදෙව් ජනතාවට තහවුරු කළේ කුමක්ද?
14. ජේසුස් වහන්සේව පාවා දීමට ජූදස් පෙලඹුනේ ඇයි?
15. අප යේසුස් වහන්සේගේ රැලට එකතුවිය යුත්තේ කෙසේද?
16. ජුදෙව්වරු වාර්ෂිකව පැවැත්වූ පාස්කු මංගල්‍යය සැමරීමට සූදානම් වූයේ කෙසේද?
17. ජේසුස් වහන්සේ පාස්කු මංගල්‍යය සැමරීමට සූදානම් වූයේ කෙසේද?
18. එම අවස්ථාවේදී ජේසුස් වහන්සේ මෙම කෘත්‍යය කිරීමේදී පැවසූ වදන් මොනවාද?
19. රොටී කැඩීමේ පිළිවෙතේ 3 ආකාර වැදගත්කම කුමක්ද?
20. උන් වහන්සේ සිහිවීම පිණිස නොකඩවා සිදු කරන මෙම ක්‍රියාවලිය තුළින් අපට අවධාරණය කරන කාරණා මොනවාද?

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
## 12 ගෙත්සෙමන යාච්ඤාවෙන් සවිය
## අවබෝධය පිරික්සුම - 12

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. ජේසුස් වහන්සේ තමන් ජීවත් වූ සමකාලීන සමාජයේ පීඩනයට ලක් වූවන්ගේ විමුක්තිය වෙනුවෙන් මැදිහත් වූයේ කෙසේද?
2. රාත්‍රී භෝජනයෙන් පසු ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් සමඟ ගියෝ කොහාටද?
3. ඔලිව කන්දේදී ජේසුස් වහන්සේට දැනුනේ කුමක්ද?
4. ඔලිව කන්දේ සිදුකළ යාච්ඤාවේ හරය කුමක්ද?
5. ජේසුස් වහන්සේ දැඩි සිත් වේදනාවෙන් කළ එම යැදුමට දේව ප්‍රතිචාරය වූයේ කුමක්ද?
6. එකල ජුදෙව් සමාජයේ සාමාන්‍ය පිළිගැනීම?
7. යේසුස් වහන්සේ අන්‍යයන්ගේ යහපත උදෙසා දේව කැමැත්තට එකඟව ක්‍රියා කලේ කුමක් තුළින්ද?
8. දුක් විඳීම වරප්‍රසාදයක් වෙන්නේ ඇයි?
9. අපට මඟ පෙන්වීම, ශක්තිය, ධෛර්යය ලැබෙන්නේ කුමක් තුළින්ද?
10. ශ්‍රාවකයන් මේ අවස්ථාවේදී නිදා සිටියේ ඇයි? මේ නිසා ජේසුස් වහන්සේ ඔවුන්ට කීවේ කුමක්ද? ඉන් අපට එළිදරව් වන්නේ කුමක්ද?
11. ජේසුස් වහන්සේ තමා පාවා දෙන පුද්ගලයා පිළිබඳව පෙර ඇඟවීමක් කළේ කොහේද?
12. යේසුස් වහන්සේව පාවා දුන්නේ කවුද? ඒ සඳහා යොදා ගත් ලකුණ කුමක්ද?
13. උත්තම පූජකයාගේ දාසයාගේ කණ කැපුවේ කවුද? එවිට ජේසුස් වහන්සේ කළේ කුමක්ද?
14. ජේසුස් වහන්සේට මෙසේ ක්‍රියා කිරීමට ශක්තිය ලැබුණේ කුමක් නිසාද?
15. ජේසුස් වහන්සේ අපට පසක් කර දෙන්නේ කුමක්ද?

❖ **හරි වැරදි ලකුණු කරන්න.**

16. ජේසුස් වහන්සේ තම ජීවිතයේ අවසාන දින කිහිපය ගත කළේ ඉතා ප්‍රීතියෙන්ය. ( )
17. ජේසුස් වහන්සේට බඩගින්න හා පිපාසය දැණුනි. ( )
18. ජේසුස් වහන්සේව පාවා දුන්නේ රිදී කාසි 30කටය. ( )
19. ජේසුස් වහන්සේව පාවා දුන්නේ තෝමස් ය. ( )
20. අපගේ ජීවිත වල අභියෝග ඉදිරියේ යාච්ඤාවෙන් දිරිමත් විය යුතුය. ( )

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
## 13 විනිශ්චය හා කුරුසිපත් වීම
## අවබෝධය පිරික්සුම - 13

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. පේරුසලමේ කරන්නට යන පිවින පූජාවට අවශ්‍ය ශක්තිය සහ ධෛර්‍යය ලබා ගන්නේ කුමකින්ද?
2. ජේසුස් වහන්සේව උත්තම පූජක මැඳුරට ගෙන ගියේ කවුරුන්ද?
3. රෝම නීතිය අනුව සිරකරුවකු සම්බන්ධයෙන් ක්‍රියා කරන්නේ කෙසේද?
4. ජුදෙව් ජනතාව ජේසුස් වහන්සේ පේරුසලමේ දේව මාළිගාවට රාජ තේජසින් පිළිගන්නේ කෙසේද? එම ජනතාව පිලාත්ගේ තීන්දුවෙන් පසුව ක්‍රියා කලේ කෙසේද?
5. යුදෙව් ආගමික නීති අනුව චෝදනා විභාග කරනු ලබන්නේ කොහේද? නායකත්වය දැරුවේ කවුද? එහි රැස්වෙන පිරිස කවුරුන්ද? එහි ගණන?
6. යුදෙව් ආගමික නීති අනුව චෝදනා විභාග කරනු ලබන්නේ කොහේද? නායකත්වය දැරුවේ කවුද?
7. නායක පූජකයන් විසින් ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමට බලය ඇත්තේ කාටද?
8. එකල රෝම ආණ්ඩුකාරවරයා කවුද? ඔහු ඉදිරියේ ජේසුස් වහන්සේට නැගූ චෝදනා මොනවාද?
9. පිලාත් ජේසුස් වහන්සේගෙන් නැගූ ප්‍රශ්ණය කුමක්ද? ජේසුස් වහන්සේ දුන් පිළිතුරු කුමක්ද? ජේසුස් වහන්සේගේ පිළිතුරු අනුව ක්‍රියා කලේ කෙසේද?
10. පිළිතුරු නොදී ජේසුස් වහන්සේ නිහඬව සිටියේ කොහේදීද?
11. අවසානයේ තීන්දුව ප්‍රකාශ කලේ කවුද? එම තීන්දුව කුමක්ද?
12. ජේසුස් වහන්සේ කුරුසිපත් කලේ කොහේදීද?
13. ජේසුස් වහන්සේට අත් වූ කුරිරු ඉරණම අභියස ස්වභාව ධර්මය ප්‍රතිචාර දැක්වූයේ කෙසේද?
14. අති ශුද්ධ ස්ථානයට පිවිසීමට වරප්‍රසාද ලැබුනේ කාටද? කුරුසි පූජාව නිසා ඉවත් වූ බාධකය කුමක්ද?
15. ජේසුස් වහන්සේ අවසානයේ ප්‍රකාශ කල වදන කුමක්ද?
16. ඉහත වදන යුදෙව් වරුන්ට වැදගත් වන්නේ ඇයි?
17. ජේසුස් වහන්සේ ප්‍රකාශ කල වදනින් අපට අවධාරණය වන්නේ කුමක්ද?
18. දෙවි සමිදාණන් වෙත ළඟා වීමට තිබූ බාධකය කුමක්ද?
19. ජේසුස් වහන්සේ තම මෙහෙවර අවසාන කලේ කෙසේද?
20. කුරුසිපත් කිරීමේ අසාධාරණ ක්‍රියාවලියේ ජේසුස් වහන්සේ මුහුණු දුන් ආකාරය අනුව අපට ගත හැකි ආදර්ශ මොනවාද?

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
# 14 දුක් ප්‍රාප්තියට ප්‍රතිචාර
# අවබෝධය පිරික්සුම - 14

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. ජේසුස් වහන්සේ ප්‍රධානතම ගෝලයා කවුද?
2. උන් වහන්සේට මහත් ලෙස ප්‍රේම කල ශ්‍රාවකයා කළ ප්‍රකාශය කුමක්ද?
3. ජේසුස් වහන්සේ කුරුසිපත් කළ අවස්ථාවේ මොහු ක්‍රියා කළේ කෙසේද?
4. ශ්‍රාවකයින්ගේ ඇදහිල්ල නොබිඳෙන පිණිස ජේසුස් වහන්සේ කළ යාච්ඤාව කුමක්ද?
5. පේදුරුතුමාගේ ජීවිතය තුළින් කිතුණු දිවියට ගෙණෙන සාක්ෂිය කුමක්ද?
6. ජේසුස් වහන්සේ කුරුසය රැගෙන යාමට උපකාර කළේ කවුද?
7. ඔහු කල එම ක්‍රියාව තුළින් කිතුණු අපට ලැබෙන පණිවිඩය කුමක්ද?
8. ජේසුස් වහන්සේ දෙස බලා හඬා වැලපුණ ස්ත්‍රීන්ට ජේසුස් වහන්සේ පැවසුවේ කුමක්ද?
9. 'තමා වෙනුවෙන් නොහඬන්න' යයි ජේසුස් වහන්සේ විසින් අපට ඒත්තුගන්වන්නේ කුමක්ද?
10. 'ඔබ හා ඔබේ දරුවන් හඬන්නේ ඇයි?'යයි ජේසුස් වහන්සේ වදාළේ ඇයි?
11. කපාල පිටිය නම් ස්ථානයේ ජේසුස් වහන්සේගේ දෙපස සිටියේ කවුරුන්ද? එම අවස්ථාවේ ජේසුස් වහන්සේව පරීක්ෂාවට ලක් කල තැනැත්තාගේ ප්‍රකාශය කුමක්ද?
12. ජේසුස් වහන්සේගෙන් විශ්වාසයෙන් කළ ඉල්ලීම කුමක්ද?
13. මෙම සිද්ධියෙන් කිතුණු අපට ලැබෙන පණිවුඩය කුමක්ද?
14. කුරුසිපත් කළ මොහොතේ උන් වහන්සේට බීමට දුන්නේ මොනවාද? දුන්නේ කවුද? ඔහු ජේසුස් වහන්සේට කළ සරදම කුමක්ද?
15. එම ගැරහුම හමුවේ සිටි ජේසුස් වහන්සේගෙන් අපට ලැබුණු පණිවුඩය කුමක්ද?
16. එඩිතරව ජේසුස් වහන්සේගේ මෘත දේහය ඉල්ලුවේ කවුද? ඔහු එය තැන්පත් කළේ කොහේද?
17. මෙතුමාගේ ක්‍රියා කලාපයෙන් අපට ලැබෙන පණිවිඩය කුමක්ද?
18. ජේසුස් වහන්සේව කුරුසිපත් කළ අය වෙනුවෙන් උන් වහන්සේගේ ආදර්ශමත් ප්‍රතිචාරය කුමක්ද?
19. ජේසුස් වහන්සේගේ ජීවිත පූජාව තුළින් අපට අත්පත් කර දුන්නේ කුමක්ද?
20. 'පියාණනි ඔබගේ හස්තයට මාගේ ආත්මය භාර දෙමි' වදාරමින් ජේසුස් වහන්සේ කුරුසිය මත අවසන් හුස්ම හෙලමින් අපට සනාථ කලේ කුමක්ද?

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
# 15 නව බලාපොරොත්තුව
# අවබෝධය පිරික්සුම - 15

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. අපට කිනම් උරුමය ලබාදීම සඳහා ජේසුස් වහන්සේ දිවිපිදුවේද?
2. මිනිස් වර්ගයාට සදාකාල ජීවිතයට දොරටු විවර කරන නව බලාපොරොත්තුවේ සුභාරංචිය කුමක්ද?
3. ජේසුස් වහන්සේ උත්ථාන වූ පසු කාන්තාවන් හිමිදිරියේ උන් වහන්සේ බැලීමට ආවේ කුමක් කිරීම සඳහාද?
4. එහ කාන්තාවන් විශ්මයට පත් කරමින් අසන්න ලැබූ දේව පණිවිඩය කුමක්ද?
5. ජේසුස් වහන්සේ උත්ථාන වූ බව ඇසූ ශ්‍රාවක පිරිස අතරින් එය සත්‍යයක් දැයි බැලීමට ගියේ කවුරුන්ද? ඔහු දුටුවේ කුමක්ද?
6. ජෙරුසෙලමෙන් කිලෝමීටර් 11ක් දුරින් පිහිටි ගම කුමක්ද? එම ගම බලා ගියේ කවුරුන්ද? ඔවුන් කතා කරමින් ගියේ කුමක් ගැනද?
7. ඔවුන්ට හමුවූ තැනැත්තා කවුද? එතුමාගෙන් ඔවුන් ඉල්ලුවේ කුමක්ද?
8. ශ්‍රාවකයන්ගේ හදවත් දැවී ගියේ ඇයි? එයින් ඔවුන්ට අවබෝධ වූයේ කුමක්ද?
9. ඔහු නැවත ජෙරුසලම බලා රැගෙන ගිය සුභාරංචිය කුමක්ද?
10. එම්මාවුස් ගමට ගිය ගෝලයින්ට අමතරව ජේසුස් වහන්සේව දර්ශණය වූයේ කාටද?
11. ජේසුස් වහන්සේ ඔවුන් අමතා පැවසූයේ කුමක්ද?
12. ජේසුස් වහන්සේ මෙලෙස ජීවමාණව ප්‍රකාශ වූයේ ඇයි?
13. ජේසුස් වහන්සේ ජීවමානව ප්‍රකාශ වීමෙන් පසු ආරාධනා කලේ කුමකටද?
14. ජේසුස් වහන්සේගේ ජීවමාන වැඩවිසීම සකල ලෝකවාසීන් වෙත ගොස් සාක්ෂි දැරුවේ කවුද?
15. කිතුණුවන්ගේ කේන්ද්‍රීය විශ්වාසය කුමක්ද?

❖ පහත සඳහන් වාක්‍ය හරි නම් ✓ලකුණද, වැරදි නම් × ලකුණද යොදන්න.

1. ජේසුස් වහන්සේ පුනර්ජීවනය වූයේ කුරුසිපත් වී දින 3කින් පසුය. ( )
2. ජේසුස් වහන්සේ පුනර්ජීවනය වූගේ මහ සිකුරාදාය. ( )
3. ශ්‍රාවකයින් ජේසුස් වහන්සේව අවබෝධ කරගත්තේ අවතාරයක් ලෙයසි. ( )
4. එම්මාවුස් ගමනේ ගිය ගෝලයින් වූයේ පේදුරු සහ ජොහාන් ය. ( )

5. පුනර්ජීවනය වූ ජේසුස් වහන්සේව මුලින්ම අත් දැක්කේ කාන්තා ගෝලයන් ය.  (    )

## ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
## 16 ශුද්ධාත්ම අනුහසට විවෘත වෙමු
## අවබෝධය පිරික්සුම - 16

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. සියළුම අනුගාමිකයින්ට උතුම් ආගමික පිළිවෙත කුමක්ද?
2. බෞතීස්ම ස්නාපනය තුළ ශුද්ධාත්මයාණන් වහන්සේගේ වැඩසිටීමෙන් කිතුණුවා දකින්නේ කුමක්ද?
3. ජුදෙව් ජනතාව අතර බෞතීස්ම පිළිවෙත පැවතුනේ කෙසේද?
4. ස්නාවක ජොහාන් බෞතීස්මයට දුන් නව අරුත කුමක්ද?
5. ස්නාවක ජොහාන් තුමාගේ කාර්යය වූයේ කුමක්ද?
6. ස්නාවක ජොහාන්තුමා කළ බෞතීස්මය ගැන ජනතාව දැනුවත් කළේ කෙසේද?
7. පැරණි ගිවිසුමේ 'ගින්න' සංකේතවත් කලේ කුමක්ද?
8. ජේසුස් වහන්සේ බෞතීස්ම කරන්නේ කුමකින්ද?
9. ශුද්ධාත්මයාණන් වහන්සේ කිතුණුවන්ව සන්නද්ධ කරන්නේ කුමකින්ද?
10. ජේසුස් වහන්සේ සේවයේ දැක්වූ උතුම් ආදර්ශය කුමක්ද?
11. ජේසුස් වහන්සේගේ බෞතීස්මය සඳහන් වූ සුභාරංචි පොත් මොනවාද?
12. ජේසුස් වහන්සේගේ ගලීලයේ නාසරත් නුවර සිට වැඩියේ කොහාටද?
13. ජේසුස් වහන්සේ බෞතීස්මය ලබන විට ශුද්ධාත්මයාණන් සංකේතවයේ වූයේ කුමකින්ද?
14. මනස්ථාපනය වූ මුළු සෙනඟක් සමඟ ජේසුස් වහන්සේ බෞතීස්මය ලැබීමෙන් ප්‍රකාශ වූයේ කුමකින්ද?
15. ජේසුස් වහන්සේගේ බෞතීස්මය තුළින් ත්‍රිත්වය පිළිඹිබු වූයේ කෙසේද?
16. ජේසුස් වහන්සේ බෞතීස්මය ලැබ යාච්ඥාවේ යෙදීමෙන් ඇති කරගත්තේ කුමක්ද?
17. බෞතීස්මයේදී ජලය භාවිතා කලේ කුමක් සඳහාද?
18. බෞතීස්මය ලබන අපගේ ජීවිත තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ තුළින් සිදු කරන්නේ කුමක්ද?
19. බෞතීස්ම ස්නාපනය ලබන සියල්ලෝම තම ජීවිත පැවැත්මෙන් විදහා පෑවේ කුමක්ද?
20. බෞතීස්මයෙන් අපට දායාද වූ දේව වරප්‍රසාද මොනවාද?

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
# 17 පරීක්ෂාවෙන් ජය ගමු
# අවබෝධය පිරික්සුම - 17

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. අප ජීවිත කාලයේ මුහුණු දෙන පරීක්ෂා ඉදිරිපත් කරන්නේ කුමකින්ද?
2. පරීක්ෂාවන් ඉදිරිපත් කරන්නේ කවුද?
3. ජේසුස් වහන්සේ බෞතීස්මය ලැබගෙන ගියේ කොහාටද? එතුමා පූර්ණ වූයේ කුමකින්ද?
4. එම ස්ථානයේ ගත කාලය කොපමණද? එහි ගත කළේ කෙසේද?
5. එසේ සිදුවීමෙන් ජේසුස් වහන්සේ බලාපොරොත්තු වූයේ කුමක්ද?
6. කාන්තාර ප්‍රදේශයක් වූ එම ප්‍රදේශයේ තිබුණේ කුමක්ද?
7. එහිදී යක්ෂයා මඟින් යොදා ගත් සූක්ෂම පරීක්ෂාව කුමක්ද?
8. ජේසුස් වහන්සේ එම පරීක්ෂාව ජය ගැනීමට උපයෝගී කරගත්තේ කුමක්ද?
9. එමඟින් ජේසුස් වහන්සේ දැක්වූ ප්‍රතිචාරය කුමක්ද?
10. යක්ෂයා ජේසුස් වහන්සේව උස් තැනකට පමුණුවා ඉදිරිපත් කළ පරීක්ෂාව කුමක්ද?
11. ජේසුස් වහන්සේ මිහිපිට වැඩියේ කුමක් ගොඩනැඟීම සඳහාද?
12. මෙම පරීක්ෂාවේදී ජේසුස් වහන්සේ දුන් පිළිතුර කුමක්ද?
13. තෙවන පරීක්ෂාව මඟින් ජේසුස් වහන්සේ මුහුණ දුන් අභියෝග කුමක්ද?
14. එනම් එහි ක්‍රියාව කුමක්ද?
15. යක්ෂයා පෙලඹවීම සඳහා ජේසුස් වහන්සේ යොදාගත් ශුද්ධ ලියවිලි පාඨය කුමක්ද?
16. ජේසුස් වහන්සේ එම පරීක්ෂා ප්‍රතික්ෂේප කරමින් දුන් පිළිතුර කුමක්ද?
17. ජේසුස් වහන්සේ කුරුසිපත් වූ අවස්ථාවේදී මෙවැනි පරීක්ෂාවට මුහුණු දුන්නේය. එය කුමක්ද? කවුරුන් විසින්ද?
18. ජේසුස් වහන්සේ දේව කැමැත්තට අවණතව තෝරාගත් මාර්ගය කුමක්ද?
19. අපගේ ජීවිත ගමනේ විවිධ අවස්ථා වල පරීක්ෂා වලට මුහුණු දීමට සිදුවේ. එමඟින් ජය ගැනීමට අප ගත යුතු ක්‍රියාමාර්ගය කුමක්ද?
20. දස පණතේ සඳහන් ආඥාවක් දෙවන පරීක්ෂාව හා සංසන්ධනය කරන්න.

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
# 18 නිවැරදි දැක්ම තුළින් ජීවිත නවෝදය
# අවබෝධය පිරික්සුම - 18

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. ජේසුස් වහන්සේ පිළිබඳ විවිධ අදහස් ප්‍රචලිත වීමට හේතු කාරණා කවරේද?
2. ජේසුස් වහන්සේ එවිට ශ්‍රාවකයන්ගෙන් විමසුවේ කුමක්ද?
3. ශ්‍රාවකයන් වෙනුවෙන් මහා ප්‍රකාශනය කළේ කවුරුන්ද?
4. ශ්‍රාවකයන් මවිතයට පත්ව උන් වහන්සේ කවුදැයි යන ප්‍රශ්ණය මතු වූ අවස්ථාව කුමක්ද?
5. ජේසුස් වහන්සේ නිතරම නිසල පරිසරයකට වැඩම කළේ කුමක් සඳහාද?
6. ජේසුස් වහන්සේ සමඟ යාච්ඤා කිරීම පිණිස කන්දකට රැගෙන ගියේ කාවද?
7. මෙම අවස්ථාවේදී සිදු වූ විශේෂ සිදුවීම් දෙකක් දක්වන්න.
8. එම කන්දේදී උන් වහන්සේගේ දෙපස සිටියේ කවුරුන්ද?
9. එම අවස්ථාවේදී ජේසුස් වහන්සේ සමඟ ඔවුන් යෙදුනු සාකච්ඡාව කුමක්ද?
10. නිදිබරව සිටි ශ්‍රාවකයන් තිදෙනා අවදි වූ විට දුටුවේ කුමක්ද?
11. මෝසෙස් සහ එලියා දර්ශණය වීමේ පරමාර්ථය කුමක්ද?
12. දිවැසිවරුන් අතර ප්‍රධානීයා සහ ව්‍යවස්ථාවලියේ ප්‍රධානියා ලෙස සංකේතවත් වූයේ කවුද?
13. වලාපටලය ශුද්ධ බයිබලයේ නිතර සංකේතවත් කරන්නේ කුමක්ද?
14. ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බවට ශ්‍රාවකයන්ට තහවුරු වූයේ කෙසේද?
15. රූප විපර්යාසය අත් දුටු ශ්‍රාවකයන් තිදෙනාට අවශ්‍ය වූයේ කුමක්ද?
16. උන් වහන්සේ ශ්‍රාවකයන්ට අවධාරණය කලේ කුමක්ද?
17. අනාගතයේ සිදුවීමක් මෙම සිද්ධියෙන් සනාථ විය. එය කුමක්ද?
18. ශ්‍රාවකයන් අනාවරණය කරගත් සත්‍ය කුමක්ද?
19. අප බැගෑපත් විය යුත්තේ කුමක් සඳහාද?
20. අපගේ ජීවිත ආලෝකමත් වන්නේ කුමකින්ද?

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය

## 19 දේව රාජ්‍යයේ වර්ධනය

## අවබෝධය පිරික්සුම - 19

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. කිතුණු අපගේ ජීවිත වල මූලික අරමුණ විය යුත්තේ කුමක්ද?
2. ජේසුස් වහන්සේගේ දේශනා වල මූලික හරය කුමක්ද?
3. ලෞකික රාජයක් තුළ ලක්ෂණ විද්‍යාමාන වේ. ඒවා මොනවාද?
4. දේව රාජ්‍ය තුළ ලක්ෂණ විද්‍යාමාන වේ. ඒවා සඳහන් කරන්න.
5. මිහිපිට දේව රාජ්‍යය ගොඩනැංවීමේ උතුම් මෙහෙවර දෙවියන් වහන්සේ විසින් කා හට පවරා ඇතිද?
6. ජේසුස් වහන්සේගේ සිය ජීවිත ආදර්ශයෙන් අපට ඉගෙනගත හැකිද?
7. දෙවියන් වහන්සේගේ දේව දරුවෝ වන්නේ කවුරුන්ද? එමඟින් ඔවුන්ට ලැබෙන්නේ කුමක්ද?
8. 'දේව රාජ්‍ය' හඳුන්වාදීම සඳහා යොදා ගත් ඉගෙනුම් ක්‍රමවේදය කුමක්ද?
9. එම උපමා සඳහා ජනතාවගේ එදිනෙදා ජීවිතයට සම්බන්ධ අත්දැකීම් භාවිතයට ගැනිනි. ඒවා දක්වන්න.
10. දේව රාජ්‍යයේ වර්ධනය සඳහා ජේසුස් වහන්සේ යොදාගත් උපමා සඳහන් කරන්න.
11. අබ ඇටය මඟින් සංකේතවත් කලේ කුමක්ද?
12. මෙම අබ ඇටය සීඝ්‍රයෙන් වර්ධනය වී විශාල ගසක් බවට පරිවර්තන වේ. පසුව එහි ලැගුම් ගන්නා පක්ෂීන් ජේසුස් වහන්සේ සමාන කලේ කාටද?
13. දේව රාජ්‍යයේ ක්‍රියාකාරීත්වය සිදුවන්නේ කවුරුන් විසින්ද?
14. ගෘහාශ්‍රිත සිදුවීමක අත්දැකීම් ජේසුස් වහන්සේ විසින් දේව රාජ්‍යයේ වර්ධනය ගෙනහැර දැක්වීමට යොදාගත් උපමාව කුමක්ද?
15. මුහුන් පිඬකට සමාන කරන ලද්දේ කුමක්ද?
16. දන්නා වූ දේ මඟින් සඟවනු අධ්‍යාත්මික සත්‍යතා වෙත ලඟිවීමට ජේසුස් වහන්සේ විසින් මඟ පෙන්වූ උපමාව කුමක්ද?
17. මෙම උපමා මඟින් දේව රාජ්‍ය පිළිබඳ සුපුවත අසා එයට විවිධ ප්‍රතිචාර 4 මොනවාද?
18. ජේසුස් වහන්සේ මෙම උපමාව මඟින් අවධාරණය කළේ කුමක්ද?
19. ඉහත උපමා මඟින් එළිදැක්වෙන පරිදි දේව රාජ්‍ය යනු කුමක්ද?
20. දේව රාජ්‍යයේ වර්ධනය අත්දැකීමට අවශ්‍ය වනුයේ කුමක්ද?

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
# 20 දේව රාජ්‍යයේ වර්ධනය ලකුණු හා ප්‍රාතිහාර්යයන්
# අවබෝධය පිරික්සුම - 20

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ ලකුණු වශයෙන් දැක්වීමට උපයෝගී කළ ක්‍රියාව කුමක්ද?
2. උන් වහන්සේ දේව රාජ්‍යයේ ලකුණු දක්වනු ලැබුවේ කාහටද?
3. ජේසුස් වහන්සේ කළ ප්‍රාතිහාර්යයන් සඳහන් වන සුභාරංචි කවරේද?
4. ග්‍රීක භාෂාවෙන් මෙම ප්‍රාතිහාර්යයන් හැඳින්වීම සඳහා භාවිතා කළ වදන කුමක්ද? ශුද්ධවූ ජොහාන් සුභසුනේ සඳහන් වන වදන කුමක්ද?
5. එම වදනෙහි අර්ථය කුමක්ද?
6. දේව රාජ්‍යයේ ලකුණු වර්ග කල හැකි කාණ්ඩ ගණන කීයද? ඒ මොනවාද?
7. ඒ කාණ්ඩ වලට අයත් ප්‍රාතිහාර්යයන් ගණන වෙන වෙනම ලියන්න.
8. දේව රාජ්‍යයේ සුවය සම්බන්ධ දේව බල අත්දැක්වූ අවස්ථා සඳහන් කරන්න.
9. ජෙරිකෝවේ අන්ධ මිනිසා සුවපත් කිරීමට පෙර ජේසුස් වහන්සේ තම මරණය ගැන ප්‍රකාශ කළේ කීවෙනි වරටද?
10. ශ්‍රාවකයන්ට වටහා ගැනීමට නොහැකි වූයේ කුමක්ද? ඒ ඇයි?
11. ශ්‍රාවකයන්ට නොහැකි වූවත් අන්ධ මිනිසා වටහාගත් සත්‍යතාවය කුමක්ද?
12. අශුද්ධ ආත්ම දුරු කිරීමේදී අනාවරණය වූයේ කුමක්ද?
13. එම දේව බලය ජේසුස් වහන්සේ වටහා දුන්නේ කෙසේද?
14. එම ක්‍රියාව සිදු කිරීමෙන් වටහා දුන් සත්‍යතාවයන් වනුයේ මොනවාද?
15. දේව රාජ්‍යයේ රජ සමඟ සමීප සම්බන්ධතාවයකට අවශ්‍ය සාධක මොනවාද?
16. ස්වභාවධර්මයේ කෙරෙන ආදිපත්‍ය පතුරුවන එකම තැනැත්තා කවුද?
17. ස්වභාව දහම අභිභවා දේව බලය දැක්වූ වැදගත්ම අවස්ථාව කුමක්ද? එය සිදුවූයේ කුමක්ද? එය සිදුවූයේ කොහේදීද? එම ක්‍රියාව සිහිකිරීමට පෙර ශ්‍රාවකයන්ට ආරාධනා කලේ කුමක්ද? එම සිද්ධියෙන් අපට අවධාරණය වන්නේ කුමක්ද?
18. ලුක් සුභාරංචියේ සඳහන් වන උත්ථාන කිරීම් මොනවාද?
19. නායින් නුවර වැන්දඹුවගේ පුත්‍රයා උත්ථාන කිරීම මඟින් දෙවියන් වහන්සේගේ ආධිපත්‍ය ගෙනහැර දැක්වූයේ කෙසේද?
20. යායිරස්ගේ දියණිය මරණින් උත්ථාන කිරීම මඟින් වටහා දුන්නේ කුමක්ද? මෙම මරණින් උත්ථාන කිරීම තුළින් සංකේතවත් වූයේ කුමක්ද?

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

**සැකසුම: ලංකා සභා ක්‍රිස්තියානි අධ්‍යාපන මණ්ඩලය, කොළඹ දියෝකීසිය**

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
# 21 දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති
# අවබෝධය පිරික්සුම - 20

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට පත් කරන ලද්දේ කවුද? දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට පත්කරන ලද්දේ කුමන මාධ්‍ය හරහාද?
2. පරිසිවරයෙකුගේ නිවසේදී භෝජන සංග්‍රහයකදී අසන ලද ප්‍රශ්ණයට ජේසුස් වහන්සේ ප්‍රතිචාර දැක්වූයේ කෙසේද?
3. උපමාවට අනුව දේව රාජ්‍යයට ආරාධනා කරන්නේ කවුද? ආරාධනා ලද ගණන කීයද? ඔවුන්ගේ ප්‍රතිචාර මොනවාද? මුල්ම ආරාධනය ලබන අය සමාන කරන්නේ කාටද?
4. නැවත භෝජන සංග්‍රහයකට ආරාධනා කරන්නේ කාටද? ඔවුන් ආරාධනය ලබන්නේ කුමන ස්ථාන වලදීද? එම ආරාධනය ලැබූවන් සංකේතවත් කරන්නේ කාවද?
5. එකල මංගල්‍යයක් සම්බන්ධයෙන් සමාජයේ සිරිත කුමක්ද? එමඟින් අපට ඉදිරිපත් කරන සත්‍යතාව කුමක්ද?
6. මහා මංගල්‍ය භෝජන උපමාවෙන් එලි දැක්වෙන ප්‍රතිපත්ති අපේක්ෂණය කුමක්ද?
7. දෙවියන් වහන්සේගේ ආරාධනාව ප්‍රතික්ෂේප කරන අයට අහිමි වන්නේ කුමක්ද? දෙවියන් වහන්සේගේ කැඳවීම හිමි වන්නේ කාටද? කැඳවීම ලැබූවන් සැරසී සිටිය යුත්තේ කුමකින්ද?
8. ජේසුස් වහන්සේට සවන් දීමට පැමිණියේ කවුරුන්ද? උන් වහන්සේට චෝදනා නැගුවේ කවුද? එම ජන කොටස් අතර ජේසුස් වහන්සේ ජනප්‍රියතාවයට පත්වූයේ ඇයි?
9. දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති පැහැදිලි කිරීමට යොදාගත් තවත් උපමාවන් මොනවාද?
10. නැතිවූ බැටළුවාගේ උපමාවෙන් එලිදක්වන ප්‍රතිපත්තිය කුමක්ද?
11. පුරාණ ඊශ්‍රායෙල් හි සාමාන්‍ය කාන්තාවන්ට රිදී කාසි මූල්‍යමය වශයෙන් මෙන්ම භාව්‍යමය වශයෙන් අගනා සම්පතක් වන්නේ ඇයි?
12. දේව රාජ්‍යයේ ප්‍රතිපත්ති පැහැදිලි කිරීම පිණිස ජේසුස් වහන්සේ රිදී කාසි භාවිතා කල උපමාව කුමක්ද? එයින් වටහා දෙන සත්‍යතාවය කුමක්ද?
13. අසීමිත ප්‍රේමය පිළිබඳ ප්‍රතිපත්ති දැක්වීමට වදාළ උපමාව කුමක්ද? එහි සඳහන් චරිත මොනවාද? එම කතාවට අනුව නිදහස සොයා ගියේ කවුද? කෙසේද?
14. ඔහුට මුහුණදීමට සිදුවූ බාධාවන් මොනවාද?
15. වැඩිමහල් පුත්‍රයාගේ ජීවන රටාව කුමනාකාර වියද?
16. පාපයේ නියම ස්වභාවය කුමක්ද?

17. මෙම උපමාවට අනුව පියාගේ චරිතය කුමනාකාරද?
18. මෙම උපමාවේ පියාගේ චරිතය තුළින් අපට අවධාරණය කලේ කුමක්ද?
19. නැතිවූ පුත්‍රයාගේ උපමා මතු වන දේව රාජ්‍යයේ අපේක්ෂණ මොනවාද?
20. මෙම උපමාවට අනුව අපට පැවරෙන විශේෂ කාර්‍යභාරය කුමක්ද?

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
## 22 දේව රාජ්‍යයේ පුරවැසියන්
## අවබෝධය පිරික්සුම - 22

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. කිතුණු අපගේ අභිලාෂය කුමක්ද?
2. දේව රාජ්‍යයේ පුරවැසිභාවය කරා ගමන් කළයුත්තේ කෙසේද?
3. දේව රාජ්‍යයේ පුරවැසියන් සඳහා නායකත්ව ධූරාවලිය කුමනාකාරද?
4. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් අතර පැන නැගුණු ප්‍රශ්ණය කුමක්ද?
5. ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ නායකත්වයට දුන් උපදෙස් මාලාව කුමක්ද?
6. දේව රාජ්‍ය පුරවැසියන්ට දැරිය යුතු නායකත්වය කුමනාකාරද?
7. ජේසුස් වහන්සේ නායකත්වයේ ආදර්ශයෙන් දැක්වූ අවස්ථා මොනවාද?
8. තමාගේ අසල්වැසියා කවරෙක්ද? යන ප්‍රශ්ණය ඇසීමට ජේසුස් වහන්සේ වෙත පැමිණියේ කවුරුන්ද?
9. උන් වහන්සේ එය පැහැදිලි කිරීමට වදාළ උපමාව කුමක්ද?
10. ඔම උපමාවේ සඳහන් චරිත මොනවාද?
11. ජුදෙව් මිනිසා වෙනුවෙන් වැය නොවූවේ කවුද?
12. සමාරිත මිනිසා වැය වූවේ කෙසේද?
13. මෙම උපමාවෙන් අපට අවධාරණය කරන්නේ කුමක්ද?
14. වංචනික ගබඩාකාරයාගේ උපමාවෙන් පැහැදිලි වූ දේව රාජ්‍යයේ පුරවැසියන්ගේ චරිත ලක්ෂණ කවරේද?
15. උපමාවට අනුව දේව රාජ්‍යයේ පුරවැසියන්ට සමාන කරන්නේ කුමක්ද?
16. දේව රාජ්‍යයේ පුරවැසියන් බැඳී සිටින්නේ කුමක් කිරීමටද?
17. දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා ඵලදායී ලෙෂ තම හැකියාව යෙදවීම ගැන වදාල උපමාව කුමක්ද?
18. රන් කාසියක් ලැබූ දාසයා ක්‍රියා කලේ කෙසේද?
19. එම උපමාව අනුව දේව රාජ්‍යයේ පුරවැසියන් ක්‍රියා කල යුත්තේ කෙසේද?
20. මෙම උපමාවෙන් පැහැදිලි කරන පුරවැසියන්ගේ චරිත ලක්ෂණ හා පුරවැසියන් සතු වගකීම් කුමක්ද?

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය

## 23 දේව රාජ්‍යයේ අභියෝග

## අවබෝධය පිරික්සුම - 23

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. දේව රාජ්‍යයේ පුරවැසිබව ලැබීම කුමනාකාරද?
2. දේව රාජ්‍යයේ පුරවැසිබව පතා ගමන් කිරීමේදී හමුවන පලවෙනි අභියෝගය කුමක්ද?
3. ස්වකැමැත්තෙන් අනුගාමී වීමට කැමැත්ත පලකල පුද්ගලයාගේ ප්‍රකාශය කුමක්ද?
4. එම ප්‍රකාශනයට ජේසුස් වහන්සේ දැක්වූ ප්‍රතිචාරය කුමක්ද? ජේසුස් වහන්සේගේ පිළිතුර අනුව තමන්ට නැතිවූ බව ජේසුතුමා පැවසුවේ කුමක්ද?
5. ජේසුස් වහන්සේ 'මා අනුව එන්න'යි පැවසූ විට ඔවුන් දැක්වූ ප්‍රතිචාර මොනවාද?
6. දේව රාජ්‍යයට සුදුසු නොවන්නේ කවුරුන්ද?
7. අනුගාමී වන්නෙකු තම මෙහෙවර ඇරඹිය යුත්තේ කෙසේද?
8. නිසි කැඳවීම ලැබෙන තෙක් අප සිටිය යුත්තේ කෙසේද?
9. කැඳවීම ලද කෙනෙක් පියාගේ භූමිදාන කටයුතු කර එන්නට අවසර ඉල්ලූ විට ජේසුස් වහන්සේ දුන් පිළිතුර කුමක්ද?
10. දේව රාජ්‍යයේ පුරවැසිභාවය ලබා ගැනීමට ප්‍රයත්න දරණ ඕනෑම අයෙකුට මුහුණ දීමට සිදුවන දෙවන අභියෝගය කුමක්ද?
11. දේව රාජ්‍යයේ සේවයේ යෙදන විට අප අත්හැරිය යුත්තේ මොනවාද?
12. රෝම නීතිය අනුව යම් මිනිසෙකු කුරුසපත් කිරීමේදී නියම වී ඇති සිරිත කුමක්ද?
13. අපට දැරීමට සිදුවන දෛනික කුරුසියන් මොනවාද?
14. කැඳවීමට ප්‍රතිචාර දැක්වීමේදී එහි භාරදූරකම ජේසුස් වහන්සේ වටහා දුන්නේ කෙසේද?
15. සේවයට කැඳවීමේදී අප යා යුත්තේ කෙසේද?
16. පරිසිවරයා සහ අයකැමියා පිළිබඳ උපමාව තුළින් අපට අවධාරණය කරන දේව රාජ්‍යයේ අභියෝගය කුමක්ද?
17. දේව රාජ්‍යයේ පුරවැසියන් සිය අවශ්‍යතා පිළිබඳ කරදර වීම අනවශ්‍ය බව පැහැදිලි කළ උපමාව කුමක්ද? ඒ සඳහා භාවිතා කළ නිදර්ශණ දෙක මොනවාද?
18. දේව රාජ්‍යයේ පුරුවැසිභාවය අපේක්ෂා කරන්නන් සෙවිය යුත්තේ කුමක්ද?
19. 
    a. පොහොසත් මෝඩයාගේ උපමාවෙන් පැහැදිලි කරන්නේ කුමක්ද?
    b. ලොව පවතින දෙආකාර ජීවන රටාවන් මොනවාද?
    c. එය පැහැදිලි කළ උපමාව කුමක්ද?
    d. ඉහත සඳහන් කළ රටාවන් දෙකටම පොදු වූ ධර්මතාවය කුමක්ද?
20. 
    a. හදවතත් දුලිදුවීමෙන් ලැබෙන්නේ මොනවාද?
    b. ඒ සඳහා මඟපෙන්වන්නේ කුමක්ද?

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
## 24 දේව රාජ්‍ය උදෙසා කැපවීම
## අවබෝධය පිරික්සුම - 24

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. දේව රාජ්‍යයේ තීරණාත්මක මොහොත වන්නේ කුමක්ද?
2. එම මොහොත ගැන් උන් වහන්සේ පැවසුවේ කුමක්ද?
3. දේව රාජ්‍යයේ පුරවැසියන් තීරණාත්මක පළමු පියවරට සූදානම් විය යුත්තේ කෙසේද?
4. එය දැක්වීමට යොදාගත් රූපකයෙන් ජේසුස් වහන්සේ අවධාරණය කරන්නේ කුමක්ද?
5. උන් වහන්සේගේ පැමිණීම සිදුවිනනේ කෙසේද? උන් වහන්සේගේ වඩින මොහොත ගැන බියක් නැත්තේ කාටද?
6. ජේසුස් වහන්සේ නැවත වඩින තෙක් දේව රාජ්‍යයේ සේවයට කැඳවූ අයගෙන් උන් වහන්සේ අපේක්ෂා කරන්නේ කුමක්ද? ඒ ගැන වදාල උපමාව කුමක්ද?
7. ජේසුස් වහන්සේගේ කැමැත්ත අනුව සේවය කල විට ලැබෙන වරප්‍රසාදය කුමක්ද?
8. ජේසුස් වහන්සේ දේව රාජ්‍යට ඇතුළු වීමට අපේක්ෂා කළ අයට ආරාධනා කළේ කෙසේද?
9. එවැනිම කැඳවීමක් කළ බයිබලයේ සඳහන් වන අනිත් පුද්ගලයා කවුද? ඔහු කළේ කුමක්ද? එම කාර්යය ඉටු කලේ කොහේදීද?
10. දුක් විඳීම ගැන ඊශ්‍රායෙල් සමාජයේ මුල් බැසගත් මතය කුමක්ද?
11. ඊශ්‍රායෙල් සමාජයේ මුල් බැසගත් මතය පිළිබඳ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම කුමක්ද?
12. සිලෝවම්හී වැසියන්ට සිදුවූ විපතින් වර්තමාන සමාජයට ලැබෙන පණිවුඩය කුමක්ද?
13. අප මනස්ථාපනය විය යුත්තේ කුමක් ගැනද?
14. ඒ ගැන ජේසුස් වහන්සේ පැවසුවේ කෙසේද?
15. ජේසුස් වහන්සේ ආයාචනා කරන්නේ කුමක් ලබා ගැනීම පිණිසද?
16. එය ලබා ගත යුතු මාර්ගය කුමනාකාරද? එම මාර්ගයේ ගමන් කිරීමේදී අවසානයේ ලැබෙන්නේ කුමක්ද?
17. දේව රාජ්‍යයට පුරවැසියන් ඇතුල්විය යුත්තේ කුමන අවස්ථාවේදීද?
18. දේව රාජ්‍යය ඇතුළු වීමට අවසර නොලැබෙන්නේ කාටද?
19. සදාතන ජීවනය නැමැති මංගල භෝජනයේ රස බැලීමට එක් වන්නේ කවුරුන්ද?
20. පටු දොරටුවෙන් ඇතුළු වීම හේතුකොටගෙන ලැබෙන්නේ කුමක්ද?

# ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය
# 25 දෙවි වදනින් ආලෝකය
# අවබෝධය පිරික්සුම - 25

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. ජේසුස් වහන්සේගේ සේවයේ විශේෂිත අරමුණ කුමක්ද?
2. දේව රාජ්‍යයේ ගුණ ධර්මය පොදු ජනතාවට ජේසුස් වහන්සේ ඉගැන්වූවේ කුමන භාෂාවකින්ද?
3. උන් වහන්සේට සවන් දීමට පැමිණි ජනතාව කවුද?
4. උන් වහන්සේ තම දේශනාවන් පැවැත්වූ ස්ථාන මොනවාද?
5. යුදෙව්වරු ධනවත්කම පිළිගත්තේ කෙසේද? ඔවුන් දිළිඳුකම පිළිගත්තේ කුමක් ලෙසද?
6. ජේසුස් වහන්සේ අධ්‍යාත්මික තත්වයක් ලෙස පැහැදිලි කරන්නේ කුමක්ද?
7. දේව රාජ්‍යයේ උරුමය ලැබෙන්නේ කාටද?
8. යහපත් දිවිපැවැත්මේ රහස කුමක්ද? සාගිනි ඇති අයට හිමි වන භාග්‍ය කුමක්ද?
9. දේව රාජ්‍යයේ සිනාසෙන්නේ කවුරුන්ද?
10. ධනවත් අයට හිමිවන විපත කුමක්ද?
11. සාගිනි වන්නේ කවුරුන්ද? දේව පිහිට පිටුදකිමින් කල් ගෙවන අයට සිදුවන්නේ කුමක්ද?
12. 'අගපෙ' යන ග්‍රීක වචනයෙන් අර්ථගන්වන්නේ කුමක්ද? ප්‍රේමයේ උල්පත කවුරුන්ද?
13. ප්‍රේමය මැනීමට දුන් මිනුම් දණ්ඩ කුමක්ද?
14. ජේසුස් වහන්සේ මේ ශ්‍රේෂ්ඨතම වදන තුළින් අපට පෙන්වන මඟපෙන්වීම කුමක්ද?
15. විනිශ්චය පිළිබඳ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම කුමක්ද?
16. අප කමාවිය යුත්තේ කෙසේද?
17. අපගේ ජීවිත වල පදනම විය යුත්තේ කුමක්ද? එය පැහැදිලි කළේ කෙසේද?
18. සදාකාලිකව රදාපැවතුනේ කාගේ අත්තිවාරමද?
19. අපගේ ජීවිත ගමන තුල නොසැලී ඉදිරියට යන්න අවශ්‍ය අඩිතාලම කුමක්ද?
20. ජේසුස් වහන්සේ අපගෙන් බලාපොරොත්තු වන්නේ කුමක්ද?

## ක්‍රිස්තියානි ධර්මය 10 ශ්‍රේණිය

## 26 දෛනික ජීවිතයට මඟ පෙන්වීම

## අවබෝධය පිරික්සුම - 26

**විනාඩි 40** **ලකුණු 100**

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

කෙටි පිළිතුරු සපයන්න.

1. දේව සම්බන්ධය ගොඩනැගීමට කිතුණු අප සතු ප්‍රභල අවිය කුමක්ද?
2. ජේසුස් වහන්සේ තම සේවා කාලයේදී යාච්ඤාව තම ජීවිතයේ අවියක් කළ අවස්ථා මොනවාද?
3. ජේසුස් වහන්සේට යාච්ඤාකිරීමට ඉගැන්වුව මැනවැයි පැවසුවේ කවුද? ඉගැන්වූ යාච්ඤාවේ නම කුමක්ද? යාච්ඤාවෙන් අයදීම වැදගත්බව පෙන්වාදුන්නේ කෙසේද?
4. යාච්ඤාවේ නිරතවීමෙන් කිතුණු අපට ලැබෙන්නේ මොනවාද?
5. පැරණි යුදෙව් නිවෙස් වල පහනක් දල්වා තබන්නේ කොහේද?
6. අපගේ ජීවිත පවිත්‍ර වන්නේ කුමකින්ද?
7. එය පිටුවහලක් වන්නේ කුමකටද?
8. අප පළමුකොට සෙවිය යුත්තේ කුමක්ද?
9. කැඳවනු ලැබූ අප අසුන්ගත යුත්තේ කොහේද?
10. ජේසුස් වහන්සේ එය පැහැදිලි කිරීමට ඉදිරිපත් කළේ කුමක්ද?
11. අප වැලකී සිටිය යුත්තේ කුමකින්ද?
12. ආගන්තුක සත්කාරය පිළිගැන්විය යුත්තේ කාටද?
13. කිතුණු ජීවිතයේ අභ්‍යන්තරික අගයන් කෙසෙල විය යුතුද යන්න පැහැදිලි කිරීමට ජේසුස් වහන්සේ යොදාගත් උපමා රූපකය කුමක්ද?
14. ලුණු වල රසය නොමැති උවහොත් සිදුවන්නේ කුමක්ද? ලුණු වල රසයෙන් අපට යමක් කල හැකි වන්නේ අප කුමක් කල විටද?
15. ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් උන් වහන්සේගෙන් කළ ඉල්ලීම කුමක්ද? ජේසුස් වහන්සේ දැක්වූ ප්‍රතිචාරය කුමක්ද?
16. ලාදුරු රෝගීන් දස දෙනා සුව කිරීමෙන් ජේසුස් වහන්සේ පැහැදිලි කලේ කුමක්ද? ස්තූතිවන්ත වූයේ කවුද?
17. අපගේ යුතුකම වන්නේ කුමක්ද?
18. ජුදා සමාජයේ පැවති ආගමික නීතිය කුමක්ද?
19. ජේසුස් වහන්සේ පිදීම ගැන අගය කළ අවස්ථාව කුමක්ද? ඇය පිදුවේ මොනවාද?
20. එයින් අපට ලබා දෙන ආදර්ශය කුමක්ද?